# පිරිත් සජ්ඣායනය සහ බෞද්ධ ශාන්ති කර්ම පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය දෙමුන්නෑවේ උපාලි හිමි*

මහායාන ධර්මය පැතිරගිය ඇතැම් රටවල විවිධ ආගමික පුදපූජා චාරිත්‍ර ආදිය හා සබැඳි ගායන, වාදන හා නර්තන විලාශයන් ජනිතව, වර්ධනය වී ඇති ආකරය තත් ආගමික සම්ප්‍රදායන් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වෙයි. ථේරවාදී බුදු දහම තුළ සංගීතය වැනි ප්‍රාසාංගික (Performing) කලාවකට අවකාශයක් විවර නොවුණි. එහෙත් ථේරවාදී බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී බෞද්ධ ආගමික චාරිත්‍ර ආදිය ඉටු කිරීමට පෙළඹුණු බෞද්ධ භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකාදීන් විසින්, කිසියම් විධියක සරල හා ප්‍රාථමික මට්ටමේ ගායන විලාසයක් පවත්වාගෙන ආ බව දැකගත හැකිය. ගාථා, අෂ්ටක, පිරිත් හා ගද්‍ය පාඨ යනාදිය මත එකී ගායන විලාශයන් පදනම්ව ඇත. ගාථා ගායනයේ ප්‍රභවය වෛදික යුගය දක්වා ඈතට දිවයයි. වෛදික ගායනා අතර ස්වර ස්ථාන දෙකකින් යුත් ගායනාව ''ගාථික '' නම් වේ. මෙම ගාථික ගායනාව බෞද්ධ ගාථා ගායනයට පදනම් වූ බව සිතිය හැකිය. ගාථා ගායනාවන්ගෙන් වැඩි හරියක් අනාඝාතාත්මක වන අතර  කිසියම් ගාථා ප්‍රබන්ධයක් ආඝාතාත්මකව ගැයෙයි. ඡන්දසින් බන්ධිත ගාථාව තුළ තාලය ජනිත වීම ස්වභාවිකය. සංස්කෘත භාෂාවෙන් හින්දු දෙවිවරුන්ට වන්දනය, ස්තුතිය සහ පිහිට පැතීම පිණිස ''අෂ්ටක'' ප්‍රබන්ධ කොට තිබේ. එහි ආභාසයෙන් බෞද්ධ භික්ෂූහු සම්බුද්ධ නමස්කාරය පිණිස පාලි භාෂාවෙන් අට්ඨක නිර්මාණය කළහ. මෙහිලා ගැනෙන පැරණිතම නිදසුන වන ජයමංගල ගාථා අට්ඨකයේ ඉතිහාසය විමසන  කල්හි එය කෝට්ටේ යුගයේදී පිරිත් පොතට ඇතුළත් කර ඇති බව පෙනෙයි. එසේම මෙහි සම්පාදකවරයා ලෙස වීදාගම හිමියෝ හඳුනාගත හැකිය. **ස, රි , ග, ම, ප** යන ස්වර වපසරිය තුළ පිහිටා ඇති හෙයින් සජ්ඣායන ඃකස්බඑසබට* ලක්ෂණ අට්ඨකයන්ගෙන්  ඉස්මතුව පෙනෙයි. ජයමංගල ගාථා අට්ඨකයේ ආභාසයෙන් නිර්මිත පාලි අට්ඨක ගාථා පංති රාශියක් පවති. මෙකී පාලි අට්ඨක ගාථා කවීන්, බෙහෙවින්ම ප්‍රිය කොට ඇත්තේ **සද්දූලවික්කීළිත** විරිතයි. එසේම වසන්තතිලකා, සද්ධරා, දෝධක වැනි විරිත් පාලි අට්ඨක ගාථා බන්ධනයේ දී උපයෝගී කොටගෙන ඇති බව දැකගත හැකිය. ක්‍රිස්තු වර්ෂ 1 වන සියවස වන විට ථේරවාදීන් අතර පිරිත් සජ්ඣායනය සම්භාවිත චාරිත්‍රයක් වශයෙන් පැවති බව පැහැදිලිව පෙනේ. තායිලන්තය, මියන්මාරය වැනි ථේරවාද රටවල **චතුභාණාවාරපාලිය** හා **පරිත්තටීකා** වැනි ග්‍රන්ථ භාවිත කිරීම එහිලා ඉදිරිපත් කළ හැකි තවත් සාධකයකි. ප්‍රාථමික ද්විතීයික හා තෘතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම මගින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත. **සරභඤ්ඤවිසාරද** භික්ෂූන් විසින් සජ්ඣායිත එකී විරිත්, තාල හා නාද රටා මහාවිහාර සම්ප්‍රදාය යනුවෙන්  හඳුනාගත හැකි අතර, නූතනයේදී විවිධ පළාත්වලට ආවේණිකව විවිධ වූ සජ්ඣායනා ක්‍රමයන් බිහිව ඇති බව ද දැකගත හැකිය.

ප්‍රමුඛ පද ඃ- අෂ්ටක, ගාථා ගායනය, ගාථික, පිරිත් සජ්ඣායනය, සරභඤ්ඤවිසාරද

* පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය udemunnewa@gmail.com